# දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ 2023 / 2024 12 ශ්‍රේණියට ඇතුළත් වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා උපදෙස්

**අවම සුදුසුකම්**:- 2022 වර්ෂයේ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල හා ගණිතය ඇතුළුව විෂයයන් 06ක් සමත්ව ඉන් විෂයයන් 03 කට අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) ලබා තිබීම.

භෞතිය විද්‍යා විෂය ධාරාව:

- ඉහත දක්වා ඇති අවම සුදුසුකම් වලට අමතරව 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය හා විද්‍යාව යන විෂයයන් දෙකටම අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථ (B) ලබා තිබීම.

**විෂයයන්:-**

භෞතිකවිද්‍යාව, රසායනවිද්‍යාව, සංයුක්තගණිතය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන්ගෙන් තුනක්.

ජෛවීය විද්‍යා විෂය ධාරාව:

- ඉහත දක්වා ඇති අවම සුදුසුකම් වලට අමතරව 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය හා විද්‍යාව යන **විෂයයන් දෙකටම** අවම වශයෙන් අධි සම්මාන සාමාර්ථ (B) ලබා තිබීම.

**විෂයයන්:-**

භෞතික විද්‍යාව/රසායන විද්‍යාව/ජීව විද්‍යාව/කෘෂි විද්‍යාව/ 07- ගණිතය යන විෂයයන්ගෙන් තුනක්.

වාණිජ විෂය ධාරාව:

- ඉහත දක්වා ඇති අවම සුදුසුකම් වලට අමතරව 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ගණිතය හෝ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය හෝ ව්‍යවසායකත්ව අධ්‍යයනය යන විෂයයන් ගෙන් එකකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම. ගණිතයට සම්මාන සාමාර්ථයක් (C) ලබා නොමැති අයදුම්කරුවන් විෂයයක් ලෙස ICT තෝරා ගන්නේ නම් එම විෂයයට (ICT) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු ය.

**විෂයයන්:-**

ගිණුම්කරණය/ව්‍යාපාර අධ්‍යයනය/ආර්ථික විද්‍යාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/කෘෂි විද්‍යාව/07- ගණිතය යන විෂයන්ගෙන් තුනක්

ඉංජිනේරු තාක්ෂණවේදය විෂය ධාරාව:

- ඉහත දක්වා ඇති අවම සුදුසුකම්වලට අමතරව 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබීම හා ගණිතයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම.

විෂයයන්

I. තාක්ෂණවේදය සඳහා විද්‍යාව
II. ඉංජිනේරු තාක්ෂණවේදය
III. ආර්ථික විද්‍යාව/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/චිත්‍ර/ව්‍යාපාර අධ්‍යයනය/කෘෂි විද්‍යාව/ගිණුම්කරණය/ 07 - ගණිතය යන විෂයයන් අතරින් එක් විෂයක්.

- ඉහත අංක III යටතේ ඇති විෂයයන් අතරින් චිත්‍ර තෝරා ගන්නා සිසුන් 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එම විෂයයට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) හෝ ලබා තිබිය යුතු ය.

## ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව:

ඉහත දක්වා ඇති අවම සුදුසුකම්වලට අමතරව 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යාව සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (s) ලබා තිබීම හා ගණිතයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම.

විෂයයන්

i. තාක්ෂණවේදය සඳහා විද්‍යාව
ii. ජෛව පද්ධති තාක්ෂණවේදය
iii. ආර්ථික විද්‍යාව/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය / චිත්‍ර / ව්‍යාපාර අධ්‍යයනය / කෘෂි විද්‍යාව / ගිණුම්කරණය/ 07 - ගණිතය යන විෂයයන් අතරින් එක් විෂයක්.

- ❖ ඉහත අංක iii යටතේ ඇති විෂයයන් අතරින් චිත්‍ර තෝරා ගන්නා සිසුන් 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එම විෂයයට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (s) හෝ ලබා තිබිය යුතු ය.
- ❖ ඉහත අංක iii යටතේ ඇති විෂයයන් අතරින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තෝරා ගන්නා සිසුන් 2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී එම විෂයයට අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (s) හෝ ලබා තිබිය යුතු ය.

## කලා විෂය ධාරාව:

- අවම සුදුසුකම් යටතේ දක්වා ඇති සම්මාන සාමාර්ථ 03 අතරින් 02ක්වත් අ.පො.ස. (උ.පෙළ) සඳහා තෝරා ගන්නා විෂයයන්ට අදාළ විය යුතු ය.
- විෂයයක් ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය තෝරා ගන්නා සිසුන් ගණිතයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (c) හෝ ICT සඳහා අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථයක් (S) ලබා තිබිය යුතු ය.
- සෞන්දර්ය විෂයයක් හැදෑරීමට අපේක්ෂිත අයදුම්කරුවන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී තෝරා ගන්නා සෞන්දර්ය විෂයයට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබීම.
- අවම වශයෙන් එක් සාමාජීය විද්‍යා විෂයයක් හෝ තෝරා ගත යුතුය. (ඉතිහාසය/ආර්ථික විද්‍යාව/භූගෝල විද්‍යාව/කෘෂි විද්‍යාව/ දේශපාලන විද්‍යාව/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මෙම විදුහලේ දී හැදෑරිය හැකි සමාජීය විද්‍යා විෂයයන් ය.)
- විෂයයක් ලෙස සිංහල තෝරා ගන්නා සිසුන් අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල විෂය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) ලබා තිබිය යුතුය.
- කලා වීෂය ධාරාව යටතේ පහත දැක්වෙන I , ii , iii තීරු තුනෙහි ඇති විෂයයන් පමණක් මෙම විදුහලේ දී හැදෑරිය හැකි අතර ඉන් **<u>එක් තීරුවකින් එක් විෂයයක්</u>** පමණක් තෝරා ගත යුතු ය.
- සමාජීය විද්‍යා විෂයයක් සමග නැටුම් හා නාට්‍ය හා රංග කලාව යන විෂයන් දෙක හැදෑරිය හැකිය.

| i | ii | iii |
|---|---|---|
| දේශපාලන විද්‍යාව | භූගෝල විද්‍යාව | සිංහල |
| ආර්ථික විද්‍යාව | ඉතිහාසය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
| චිත්‍ර | බෞද්ධ ශිෂ්ටාචාරය | කෘෂි විද්‍යාව |
| නැටුම් | | ICT |
| සංගීතය | | නාට්‍ය හා රංග කලාව |
| 07 ගණිතය | | |

විශේෂ අවධානයට:

**<u>සැලකිය යුතුයි:</u>**

I. අයදුම්පත සමඟ රු.110.00 ක මුද්දර ඇලවූ, නම, ලිපිනය, **<u>නොලියන</u>** ලද "9×4" ලිපි කවර 01ක් ද බහා ලන්න.(ඇමිණීමෙන් වළකින්න.)

II. සම්පූර්ණ කළ අයදුම්පත හා මුද්දර කවරය **<u>"9×6"</u>** ප්‍රමාණයේ කවරයක ඇතුළත් කර 2023/12/11 වන දිනට පෙර විදුහලට ලැබෙන සේ **<u>විදුහල්පති, දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලය, තිස්සමහාරාම.</u>** යන ලිපිනයට **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** එවිය යුතු ය.

III. අයදුම්පත යොමු කරන කවරයේ වම් පස ඉහළ කෙළවර **<u>"2022 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ප්‍රතිඵල මත 12 ශ්‍රේණියට ඇතුළත් වීම - ..................... විෂය ධාරාව"</u>** ලෙස සඳහන් කරන්න. (ඉල්ලුම් කරන විෂය ධාරාව හිස්තැනෙහි සඳහන් කරන්න.)

- ❖ එක් විෂය ධාරාවක් සඳහා එක් අයදුම්පත්‍රයක් පමණක් මෙම විදුහලට යොමු කළ යුතු ය.
- ❖ දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ 12 ශ්‍රේණිය සඳහා අයදුම්පත් යොමු කිරීමේ දී විදුහල මගින් නිකුත් කළ අයදුම් පත්‍රය පමණක් භාවිත කළ යුතු ය.
  (දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් සුදු පාට අයදුම්පත ද, වෙනත් පාසල්වල සිසුන් රෝස පාට අයදුම්පත ද භාවිත කරන්න.)
- ❖ සුදුසුකම් සහිත දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරා ගැනීමෙන් **<u>පසුව තවදුරටත් පුරප්පාඩු පවතී නම් පමණක්</u>** ඒ ඒ විෂය ධාරාව සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති වෙනත් පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අයදුම්පතෙහි අනු අංක 07, අනු අංක 08 (iii) හා අනු අංක 11 හි සඳහන් තොරතුරු සඳහා ලකුණු ලබා දී ඉහළ ලකුණු ඇති සිසුන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඉන් ඉහළම ලකුණු ලබා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් අදාළ පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබයි.
- ❖ අවශ්‍ය අවම සුදුසුකම් හෝ ඒ ඒ විෂය ධාරාව හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් **<u>දැනුම් දීමකින් තොරව</u>** ප්‍රතික්ෂේප කරනු ලබයි.
- ❖ ජෛවීය විද්‍යා විෂය ධාරාව යටතේ 07-ගණිතය හදාරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට වෛද්‍ය විද්‍යාලයට යාමට නොහැක. (දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ දප/අදෙ/අසං/07 අංක දරන 2020.03.07 දිනැති ලිපියට අනුව)
- ❖ විදුහලට තෝරා ගන්නා සිසුන් 2025 අ.පො.ස. (උ.පෙළ) විභාගයට අයදුම් කිරීම සඳහා චක්‍ර ලේඛ අනුව සපුරාලිය යුතු සුදුසුකම් අනිවාර්යෙන්ම සපුරා තිබිය යුතුය. අවශ්‍ය සුදුසුකම් ( පාසල් පැමිණීමේ ප්‍රතිශතය 80% හෝ ඊට වැඩි, පාසල් පාදක ඇගයීම් සඳහා ඉදිරිපත් වී තිබීම, කණ්ඩායම් ව්‍යාපෘතිය අවසන් කර තිබීම, වාර විභාග 05 සඳහා පෙනී සිටීම.) සපුරා ගැනීමට අපොහොසත් වන සිසුන්ට 2025 අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා පාසලෙන් අයදුම් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.
- ❖ අයදුම්පත්‍රය සමග මෙම උපදෙස් පත්‍රිකාව පාසලට යොමු **<u>නොකළ යුතුය.</u>**
- ❖ අයදුම්පත්‍රය භාර ගැනීම ඔබ මෙම විදුහලේ අදාළ විෂය ධාරාව සඳහා තෝරා ගැනීමක් සේ නොසලකන්න.
- ❖ වෙනත් පාසලක නොමැති විෂයක් මෙම පාසලේ තිබී ඔබ එය තෝරාගත්ත ද අදාළ විෂය ධාරාවට තෝරා ගන්නා අවම ලකුණු ලබා නොමැතිනම් එම විෂය තෝරා ගැනීම බඳවා ගැනීම සඳහා විශේෂ සුදුසුකමක් නොවන බව කාරුණිකව සලකන්න.
- ❖ යම් විෂය ධාරාවක් හදාරමින් සිටිය දී වෙනත් විෂය ධාරාවකට මාරුවීමට නම් එය පළමු වාරය තුළ සිදු කළ යුතු අතර මාරුවන නව විෂය ධාරාවට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතුය. එසේම මාරුවන නව විෂය ධාරාවේ බඳවා ගැනීමේ අවම ලකුණට වඩා ලකුණු ලබා තිබිය යුතු ය. (වෙනත් පාසල්වල සිසුන්) එසේම මාරුවන නව විෂය ධාරාවේ පුරප්පාඩු ද තිබිය යුතු ය.
- ❖ අයදුම්පතෙහි ප්‍රතිඵල ලිවීමේ දී හදාරන ලද කාණ්ඩ විෂයයන් තුන නිවැරදි කාණ්ඩය ඉදිරියේ සඳහන් කිරීමට කටයුතු කරන්න. (කාණ්ඩ විෂය ලේඛනය පසු පිට දක්වා ඇත.)
- ❖ අ.පො.ස. (උ.පෙළ) විෂය අංක හා විෂය නාම ලේඛනය( දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ දී උසස් පෙළ සඳහා හැදෑරිය හැකි) පසු පිට දක්වා ඇත.

## අ.පො.ස. (සා.පෙළ) කාණ්ඩ විෂය නාම ලේඛනය

| පළමු විෂය කාණ්ඩය | දෙවන විෂය කාණ්ඩය | තෙවන විෂය කාණ්ඩය |
|---|---|---|
| ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | සංගීතය (පෙරදිග) | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| භූගෝල විද්‍යාව | සංගීතය (අපරදිග) | කෘෂි හා ආහාර තාක්ෂණය |
| පුරවැසි අධ්‍යාපනය | සංගීතය (කර්ණාටක) | ජලජ ජීව සම්පත් තාක්ෂණය |
| ව්‍යවසායකත්ව අධ්‍යයනය | චිත්‍ර | ශිල්ප කලා |
| දෙවන භාෂාව (සිංහල) | නැටුම් (දේශීය) | ගෘහ ආර්ථික විද්‍යාව |
| දෙවන භාෂාව (දෙමළ) | නැටුම් (භාරත) | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය |
| පාලි | ඉංග්‍රීසි සාහිත්‍ය රසාස්වාදය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
| සංස්කෘත | සිංහල සාහිත්‍ය රසාස්වාදය | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය |
| ප්‍රංශ | දෙමළ සාහිත්‍ය රසාස්වාදය | නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය |
| ජර්මන් | අරාබි සාහිත්‍ය රසාස්වාදය | නිර්මාණකරණය, විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය |
| හිංදි/රුසියන් | නාට්‍ය හා රංග කලාව (සිංහල) | විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය (සිංහල) |
| ජපන්/කොරියන් | නාට්‍ය හා රංග කලාව (දෙමළ) | විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය (දෙමළ) |
| අරාබි/චීන | නාට්‍ය හා රංග කලාව (ඉංග්‍රීසි) | විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය (ඉංග්‍රීසි) |

## අ.පො.ස. (උ.පෙළ) විෂය අංක හා විෂය නාම ලේඛනය

( දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයේ දී උසස් පෙළ සඳහා හැදෑරිය හැකි)

| විෂය අංකය | විෂය නාම ලේඛනය |
|---|---|
| 01 | භෞතික විද්‍යාව |
| 02 | රසායන විද්‍යාව |
| 07 | ගණිතය |
| 08 | කෘෂි විද්‍යාව |
| 09 | ජීව විද්‍යාව |
| 10 | සංයුක්ත ගණිතය |
| 13 | සාමාන්‍ය ඉංග්‍රීසි |
| 20 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය |
| 21 | ආර්ථික විද්‍යාව |
| 22 | භූගෝල විද්‍යාව |
| 23 | දේශපාලන විද්‍යාව |
| 25 A | ශ්‍රී ලංකා හා ඉන්දීය ඉතිහාසය |
| 29 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය |
| 32 | ව්‍යාපාර අධ්‍යයනය |
| 33 | ගිණුම්කරණය |
| 45 | බෞද්ධ ශිෂ්ටාචාරය |
| 51 | චිත්‍ර කලාව |
| 52 | නර්තනය (දේශීය) |
| 54 | පෙරදිග සංගීතය |
| 57 | නාට්‍ය හා රංග කලාව (සිංහල) |
| 65 | ඉංජිනේරු තාක්ෂණවේදය |
| 66 | ජෛව පද්ධති තාක්ෂණවේදය |
| 67 | තාක්ෂණවේදය සඳහා විද්‍යාව |
| 71 | සිංහල |